න්. චලනය නිසා ආකාර ඇති වෙනවා. ආකාර නිසා හතර භූත අවස්ථාවන් ඇති වෙනවා. මේ හතර භූත සංකලනයෙන් මේ ද්‍රව්‍යමය ලෝකය ඇති වෙනවා. එසේම මේ මුල් ස්වභාවයට තිබෙණ තවත් ලක්‍ෂණයක් තමා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ලක්‍ෂණය. ඒ කියන්නේ හැම දෙයක්ම වෙනස් වෙනවා, බෙදෙනවා, දෙකඩ වෙනවා. එසේම කිසිම හරයක් නැති දෙයක් ලෙසට එළි වෙනවා. මේ චක්‍රයානුකූල චලනයෙන් සියලු දේ උපන් බවත්, ඊළඟට මේවා සියල්ල විනාශ වී යන බවත් හොඳට තේරුම් ගැනීමට හැමවිටම උනන්දුව තිබුණා, එසේම ඔහුට හැකි වුණා.

දේවල් හැටියට පෙනෙන මේ ලෝකය ඇතුළත ඉතා කුඩා අංශු ලෝකයටම ගියොත් අපට පෙනෙනවා ඇති වීම, පැවතීම, විනාශය යන ආකාරයට වන චලනයන්. වෙනස් වීම, බිඳීම, හරසුන් බව කියන ස්වභාවයත් හැර වෙන දෙයකුත් නෑ, නිකම්ම චලනයක් විතරයි. මේ සියල්ල ඔහු හැඳින්වූයේ දුක කියලයි. ඒ හිතට ඇති වන හැඟීම හැටියට නෙවෙයි. යථාර්තයේ පිහිටීම හැටියට ඇති සත්‍යයයි. ඊළඟට ඔවුන් වටහා ගත්තා මේ දුක පිළිබඳ සත්‍යය ඇයි අපට කෙළින්ම වැටහෙන්නේ නැත්තේ කියල. ඒකට හේතු තමා මේ චලනයෙන් මතුවන ද්‍රව්‍යමය ලෝකයට අපි ඇලිල ඉන්න එක. ඒ ඇලීම නිසා හතර මහ භූතයන්ගේ ස්පර්ශය තුළ අපි හිරවෙලා ඉන්නේ. මේ ඇලීම නිසා අනිත්‍ය ස්වභාවය වෙනුවට අපි දකින්නේ ඝන බව, ද්‍රව බව, වායු බව, හා ගිනියම් බව ආදියයි. ඒ ඇලීම තුළින් මැවී පෙනෙන ද්‍රව්‍යමය ලෝකය තුළ ඇති යථාර්තයට අපි හිරවෙනවා. ඒ අනුව ඔහු දෙවන සත්‍යය ලෙස ප්‍රකාශ කළේ දුක් සත්‍යය නොපෙ-නෙන්නේ අනුභූති දේවල් වලට ඇලීම නිසයි. ඇලීම උඩින් අපි අනුභූතික ලෝකයට එහා ඇති මූලික ස්වභාවය දකින්න මැලි වෙනව. බැරි එවුන් බවට පත් වෙනවා. ඊළඟට ඔහුට පෙනුන තමන්ට මේ

***එදා මගධ දේශයේ විශාල නිදහස් විවාදයන්ට සංවාදයන්ට ඉඩ ලැබුණ තැනක් වී තිබුණා. සිදුහත් ඇතුළ් වුණේ මේ සත්‍ය සොයන්නා වූ විවාදාත්මක හා විමසුම් සමාජයටයි.***

ඇත්ත ඇති සැටියෙන් දැනෙන්නේ කොහොමද කියල.  ඒක කරන්න පුළුවන් වුණේ පෙරලිකාරී ජීවිතය තුළින් ඇලීම යට කරගෙන හිත අලුත් තලයකට ගෙන ගිය නිසා. ඕනෑම සිතක් තුළ හැම විටම නිවුන බවත්, අනෙක් අතට ඇලීමත් තරගයක තියෙන්නේ. නිවීම හා ඇලීම අතරේ කඹ ඇදිල්ල තුළ අධිවිනිශ්චයක් තුළ හැම කෙනෙක්ම ක්‍රියාත්මක වෙන්නේ.

ඒ අනුව අවසාන වශයෙන් ඔහු තේරුම් ගත්තා නිවීම සිත තුළ ඇති කරගන්නට නම් තමා කළා වගේ විනයක් තුළ හිරවෙලා ඇතුළත සොයා බැලීමකට යොමු කරන්න ඕනෑ බව. එවැනි විමසුමක් තුළින් යථාර්තය ගැන නිසි ලෙස වැටහීමක් ලබා ගන්නට ඉඩ ලැබෙනවා. ඒ වැටහීම ප්‍රඥාවක් මුළු යථාර්ථයම ගැන. ඇලීම යටවෙලා නිවුණ සිතින් ඇතිවෙමින්, පවතිමින්, නැති වෙමින් යන පරම ස්වභාවය පැහැදිලිව තේරුම් ගත හැකි වෙනවා. මේ අනුව ඔහු දැනුම තල දෙකකට බෙදුවා. පළමුව, සාමාන්‍ය දැනුම තර්කයෙන් ලබාගන්නට හැකියි. ඒ මේ ද්‍රව්‍යයම ලෝකය තුළ එයට යට වී ලබා ගන්න දැනුම. ඔහු දැක්ක ලොකුම සත්‍යය තමා තර්කය කියන්නේ, මේ ළඟපාත පැතිරුණ අවකාශයට පැනවුන රීතියක් කියන එක. එයින් ඇත්ත ඇතිසැටියෙන් එළිවෙන්-න් නෑ. ඇත්ත අපට නිකම්ම හමු වන අනුභූති යථාර්තයට එහා යන එකක්. අනෙක් අතට මේ අනුභූත ලෝකයට යට නොවී ලබන අභිඥාණයක්. සියල්ල ඇති වෙමින්, පවතමින්, නැති වෙන අනිත්‍ය ලෙස වටහා ගැනීම. ඒ තමා ඒ දෙවැනි දැනුම. එතැනදි ඇතිවීම, බිඳවැටීම, නැවත ඇතිවීම මූලික රීතිය බවට පත්වෙනවා. මේ විදියට නුවන දෙකට කඩල සාමාන්‍ය දැනුම, ඊට එහා යන අභිඥාණය වශයෙන් තල දෙකක දැනුම ඉදිරිපත් කරීම මනුස්ස සමාජයට කරපු ලොකුම සේවයක්.

මේ විදියට ලෝකය දෙස බලන්න මේ මිනිසාට හැකි වුණේ ඔහු ඉතාම දක්‍ෂ පුද්ගලයෙක් නිසා පමණක් නෙවෙයි, එදා තිබුණ සමාජය තුළ ඇති වුණ විශේෂ බුද්ධි ලෝකයේ විකසිත වීමක් උඩයි. එදා මගධ දේශයේ විශාල නිදහස් විවාදයන්ට සංව-ාදයන්ට ඉඩ ලැබුණ තැනක් වී තිබුණා. සිදුහත් ඇතුළ් වුණේ මේ සත්‍ය සොයන්නා වූ විවාදාත්මක හා විමසුම් සමාජයටයි. අනෙක් අතට ආර්යවාදී පාලනය බිඳ වැටිල සමූහ ජනපදවල පිබිදීම එම උතුරු ඉන්දීය සමාජය තුළ ඇති වෙලා තිබුණ. සාමූහික ජන ජීවිතය ගැන පදනමක් තිබුණ නිසා තමයි සාංඝික සමාජයක් තම ගෝලයින්ට යෝජනා කරන්නට හයියක් මේ ප්‍රබුද්ධ පුද්ගලයාට ලැබුණේ. මුළු උතුරු ඉන්දියාවත් අවට රටවල්වලටත් දේශනා පවත්වමින් මේ අදහස් පතුරුවා යැවූ මේ පිබිදුනු මිනිසා වයස 80 දී ලෙඩ වෙලා මැරුණා. ඔහු වයසට යන විට අබලන් වුණා. බඩ තුළ තුවාල ඇති වෙලා ලේ බඩ යන තත්ත්වය ඇති වුණා. අන්තිම දවස්වල චුන්ද කියන හිතවතෙක් ඌරු මස් කෑමට දීල එයින් තරමකට සුවයක් ලබා ගත්තා. එක වෙලාවක පිපාසයට කිළිටු සිවුරකින් පෙරපු මඩ මතුර බොන තැනටත් ඔහු අසරණ වුණා. ඒත් ඔහු සැනසීමෙන් මිය ගියා. ඔහුගෙන් ඉතිරි වුණ කිසිම දෙයක් නෑ, මේ විශ්වයේ පැවැත්ම ගැන ඔහු සොයාගත් සතර සත්‍යය හැරෙන්න. ඔහු අපෙන් බලාපොරොත්තු වුණේ ඒ දැනුම අනුව ඇත්ත හඳුනාගෙන සිහියෙන් ජීවත් වීම පමණයි.

■


**කාරුණික ඉල්ලීමක්**

දරුවන් නොමැති කාරුණික යුවලකට දරු සම්පතක් ලබා ගැනීමට උදව් කළ හැකි පරිත්‍යාගශීලී කාන්තාවකටයි මේ ආරාධනය. ඔබ දරු සම්පත් හිමි දැනටමත් ඔබේ පවුල සම්පූර්ණ කර ඇති වයස අවු 36 ට අඩු කාන්තාවක් නම් ඔබට ඔබේ ඩිම්බ පරිත්‍යාග කිරීමෙන් මෙම යුවලගේ බලාපොරොත්තු සපුරා ගැනීමට උපකාර විය හැකි ය. කරුණාකර anne28878@gmail.com ලිපිනයට ලියන්න
සියලු තොරතුරු වල රහස්‍යභාවය සුරැකේ.



**ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා**

Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

**DENTIST**

**Facilities are also available for :**
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

Sannasa

**1254 Plenty Road, Bundoora 3083**
**Tel : 03 9467 7760**



**Face the CHANGE in Australian Immigration**

## Latest Facts

Australian Government announced the Migration Program for financial year 2010-2011 and there will be 113 850 places for skill migration program (General Skill Migration, Employer Sponsored Skill Migration, Business Skill Migration, Distinguished Talent visas)

A new Skill Occupation List (SOL) has been introduced with 196 Occupations that has come in to effect from 1 July 2010. The previous SOL, originally introduced in 1999, with over 400 Occupations ceased on 30th June 2010

A new Skill Occupation List (SOL) has been introduced with 492 Occupations for State & Territory Nominated General Skill Migration visa subclass that has come in to effect from 1 July 2010.

Australian Govt. temporarily suspended accepting off-shore General Skill Migration (GSM) Applications (for applicants outside Australia) on 8th May 2010 and re-opened on 1 July 2010

Overseas Students who held or made a valid application for subclass 485 – Graduate Skill Visa before 8th February 2010, are also Eligible to apply for Permanent Residence by 31st December 2012

Overseas Students who hold a valid student visa subclass 572, 573, 574 completing the Australian qualifications in Australia are also eligible to apply for subclass 485 – Graduate Skill Visas by 31st December 2012

Those applicants for 485 who do not fall in to the new skill occupation list may be able to obtain their Permanent Residence eventually on Employer Nomination Scheme (ENS) & Employer Nominated visa applications are the top priority for visa grants of the Australian Government.

GUSS DESIGN 9769 0099

**TO MEET THE CHALLENGES WITH THE LATEST CHANGES, YOU ARE WELCOME TO CONTACT**



**Susantha Katugampala** LL B (Monash)
**Barrister & Solicitor**
MARN: 9601070
Accredited Immigration Law Specialist
LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

**Susantha Katugampala, and the rest of the TEAM OF LAWYERS & THE STAFF from Australia or Sri Lanka, dedicated to provide you the best advice and service.**

| COLOMBO OFFICE: | MELBOURNE OFFICE: |
| --- | --- |
| AUSTRALIA GATEWAY — Australian Migration Consultants | FAIRFIELDS — IMMIGRATION LAWYERS - MELBOURNE |
| HILTON RESIDENCIES<br>Union Place, Colombo 2<br>Tel: +94 11 2300 627<br>+94 777 347 670 | 10 Morrison Place<br>Melbourne East<br>Tel: +61 3 9650 4557<br>+61 417 851041 |

**Skill Migration | Business Migration | State Sponsorships**
**Family Migration | Spouse Visas | Parent Visas | MRT Appeals**

*We Deliver Results..*